# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2261/64 - 2022 ජනවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2022.01.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WLP/LAN/FLD04/ACQ/02.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/ පරවශතාවේ විස්තර*:

මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැල්ලාන ගමේ පිහිටි මූ.පි. මාර 2553 පිඹුරේ මතු සඳහන් ඉඩම වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

01. කැබලි අංක 1
ඉඩමේ නම: කොස්ගහහේන ; වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත, රබර් වගාවක් ඇත; හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනයන්: විධායක අධ්‍යක්ෂක, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්: 0.0797.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 මාර්තු මස 28 වැනි දින පූ. භා. 10.00 ට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 මාර්තු මස 14 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

**තුෂාරි පී. සූරියආරච්චි,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2021 දෙසැම්බර් මස 24 වැනි දින,
වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 1-0068


1A - G 35767 – 19 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*